# නිරෝධායන පනත යටතේ ගැසට් කරන්නැයි යෝජනාවක්

කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ මැතිවරණ පැවැත්වීම සම්බන්ධව නිකුත් කළ මාර්ගෝපදේශ පිළිබඳව මැතිවරණ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ වන දේශපාලන පක්ෂ ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කර එය "නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ පනත" යටතේ ගැසට් කිරීමට යෝජනා කරමින් පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයාට ලිපියක් යවා ඇත.

එම මාර්ගෝපදේශ ජන ජීවිත සුරක්ෂිත කිරීමේ අරමුණින් ඉතා සාධනීය වුව ද, සමහර නිර්දේශ මැතිවරණය අරභයා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ද යන්න සංවාදයක් දේශපාලන පක්ෂ ඇතුළු විවිධ පාර්ශ්වයන් මතු කරමින් සිටින බවද එම ලිපියේ සඳහන්ර කර ඇත.

එකඟතාවයක් ඇතිකර ගැනීම හරහා මැතිවරණ ක්‍රියාවලියේ ප්‍රමුඛතම පාර්ශ්වයක් වන දේශපාලන පක්ෂ නියෝජිතයින් දැනුවත් වීම මගින් මෙකී නිර්දේශ පහසුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා හැකියාවක් ලැබෙනු ඇතැයි විශ්වාස කරන බවත්, එසේ නොවන තත්ත්වයක් තුළ කොතරම් යහපත් යෝජනා තිබුණ ද ඒවා ප්‍රායෝගිකව සහ ඵලදායක අයුරින් සමාජය තුළ ක්‍රියාත්මක කළ නොහැකි නම් ඉන් සිදුවනුයේ එකී මාර්ගෝපදේශ නොතකා හැරීම හේතුවෙන් මැතිවරණ ක්‍රියාවලිය තුළ අනවශ්‍ය ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වන බවද පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂවරයා සිය ලිපියේ වැඩිදුරටත් දක්වා තිබේ.